# අනාගතයක් නැති සිංහලය

කාලය යන්න අවිඥානික සත්ත්වයන් විසින් නිර්මානය කෙරෙන්නක් ලෙස පසුගිය සතියේ පළවූ ලිපියෙහි අවසාන ඡේදයෙහි සඳහන් වී ඇත්තේ මුද්‍රණ දෝෂයකින් ය. එය සවිඥානික සත්ත්වයන් යනුවෙන් නිවැරදි විය යුතු ය. අපට මෙහි දී ඇති ප්‍රධාන ප්‍රශ්නය ද එයම ය. කාලය යනු අපේ නිර්මානයකි. පුටුව, මේසය වැනි දෑ මෙන් ම කාලය ද නිර්මානයක් වෙයි. අප යම් යම් දෑ තේරුම්ගැනීම සඳහා කාලය යන සංකල්පය නිර්මානය කරගෙන ඇත.

වෙනස් නොවන වස්තු නිර්මානය කළ අපි ඒ වස්තු වෙනස්වන බව දැන ඒ වෙනස්වන්නේ කාලයෙහි යැයි කියමු. ඉන් පසු කාලය ඉදිරියට යන්නක් යැයි සිතමු. ඉන් පසු අප අසන්නේ කාලය පසුපසට නොයන්නේ ඇයි ද යන්න ය. කාලය යන සංකල්පය අප නිර්මානය කර ඇති ආකාරයට එයට පසුපස්සට යා හැකි ද යන ප්‍රශ්නය ඇසීමට සිදු වී ඇත. අද මහනුවරින් පිටත්වන බසයක් ඊයේ කොළඹට ළඟාවිය හැකි ද?

කාලය යන සංකල්පයට ආකෘතියක් නිර්මානයකිරීමේ දී අප අපට හොරා මෙන් යොදාගත් අදහසක් විය. එනම් අංශුවක් හෝ වස්තුවක් හෝ ක්‍රියාවලියක් බවත් එහි දී රූපයක් ඇති වී නැති වී යන්නේ එහි අඩංගු තොරතුරුවලින් යම් ප්‍රමාණයක් හා නව තොරතුරු යම් ප්‍රමාණයක් අනුගාමී රූපයට ලබා දී ය යන්න ය. වස්තුවක් හෝ අංශුවක් හෝ යනු එවැනි ඇති වී නැතිවන රූප ක්‍රියාවලියකි. මෙහි දී අප යොදාගත් වචනය වූයේ අනුගාමී යන්න ය. එහෙත් අනුගාමී යන්නෙහි තේරුමට අනුව අනුගාමී රූපය ඇතිවිය යුත්තේ අදාළ රූපයට පසුව ය. දැන් පසුව යන වචනයෙහි කාලය යන්න ඇතුළත් වී ඇත. පසුවක් ඇත්තේ කාලයෙහි ය. අනුගාමී රූප යන අදහස නොමැතිව අපට කාලය යන සංකල්පය සඳහා ආකෘතියක් නිර්මානය කරගත හැකි ද?

සිංහල බෞද්ධයනට අනුව කාලය යනු පඤ්ඤත්තියක් වෙයි. එය පුටුවක්, මේසයක් වැනි සංකල්පයකට වඩා වෙනස්වන්නේ පුටුවක් මේසයක් ආදී සංකල්ප සමග මනස හැරෙන්නට වෙනත් ඉන්ද්‍රිය ද සම්බන්ධ වන බැවින් ය. පුටුව යන සංකල්පය නිර්මානය කෙරෙන්නේ ඇස, ස්පර්ශය ආදිය ද සෘජුව ම සම්බන්ධ කරගනිමින් ය. එහෙත් කාලය යන සංකල්පය නිර්මානය කිරීමේ දී එලෙස අනෙක් ඉන්ද්‍රිය සෘජුව සම්බන්ධ නො වෙයි. කාලය වැනි සංකල්ප සඳහා පඤ්ඤත්තිය යන්න යෙදෙන්නේ ඒ සංකල්ප එලෙස අනෙක් ඉන්ද්‍රියයන්ගේ සෘජු සම්බන්ධයක් නොමැතිව නිර්මානය කරගත හැකි බැවින් යැයි සිතිය හැකි ය.

කෙසේ වෙතත් කාලය යන පඤ්ඤත්තිය සම්බන්ධයෙන් අපි යම් ආකෘතියක් නිර්මානය කෙළෙමු. ඒ ආකෘතිය ද අවසානයේ දී බටහිර අර්ථයෙන් ගත්කල සාර්ථක එකක් නොවන්නේ එහි ද කාලය යන්න ගැබ් වත ඇති බැවින් ය. මේ එතරම් පුදුමයට පත්විය යුත්තක් නො වෙයි. කාලය යන සංකල්පය සඳහා ඇතැම්විට කාලය යන අදහස නොමැතිව ම ආකෘතියක් නිර්මානය කරගැනීමට පසු දවසක හැකි වනු ඇත. එහෙත් එසේ නොවුණ ද අප ඉන් නොසැලිය යුතු ය. කාලය යන සංකල්පය, අවශ්‍ය නම් පඤ්ඤත්තිය කාලය යන අදහස නොමැතිව නිර්මානයකිරීමට නොහැකි වීම එයට හේතුව විය හැකි ය.

සංකල්පයක් සඳහා ආකෘතියක් නිර්මානයකිරීමේ දී ඒ සංකල්පය යම් ආකාරයකින් හෝ යොදාගත නොහැක්කේ ඒක රේඛීය චින්තනයක ය. අපේ චින්තනය ඒක රේඛීය නොව චක්‍රීය වෙයි. ඒක රේඛීය චින්තනයක සංකල්පයක් සඳහා ආකෘතියක් ඒ සංකල්පය පිළිබඳ අදහසක් හෝ නොගැවී නිර්මානය කළ යුතු ය. එහෙත් චක්‍රීය චින්තනයක එය එසේ වීම අනිවාර්ය නො වෙයි. චක්‍රීය චින්තනයක සියළුම සංකල්ප ඒ අදාළ සංකල්පය යමතමින් හෝ යොදාගනිමින් නිර්මානය කළ යුතු යැයි නො කියැවෙයි. ඇතැම් සංකල්ප සඳහා ඒ එසේ විය හැකි ය.

අපි දැන් සිංහල බෞද්ධයන්ගේ ව්‍යවහාරයක් පිළිබඳ අපේ සිත් යොමුකරමු. සිංහල භාෂාවේ අනාගත කාලය සඳහා වෙනම රූපයක් නැත. අපට ඇත්තේ අතීත කාලයක් හා අනතීත කාලයක් පමණකි. එය සිංහල බුදුසසුන පිහිටුවීමට පෙර සිටම සිංහල භාෂාවේ ලක්ෂණයක්ව පැවතී යැයි සිතිය හැකි ය. මම ගියෙමි යන්න අතීත කාලය වන අතර මම යමි යන්න වර්තමාන කාලය වෙයි. මම යන්නෙමි යන්න ද වර්තමාන කාලය මිස ඊනියා අනාගත කාලයක් නො වෙයි.

© Prof. Nalin De Silva

කටවචනයෙහි දී නම් මා යනවා යැයි අපි කියමු. අනාගතයක් හැඳින්වීමට අවශ්‍ය ම නම් අපි මා හෙට යනවා ආදී වශයෙන් කාලය විස්තර කරන පදයක් ද සහිතව ප්‍රකාශ කරමු.

සිංහල බෞද්ධයන්ට ඇත්තේ වර්තමානය පමණක් යැයි කීව ද එහි වරදක් නැත. එයට හේතුව අත්විඳිය හැක්කේ වර්තමානය පමණක් වීම ය. අපට අතීතය වුව ද අත්විඳිය හැක්කේ වර්තමානයෙහි ය. අනාගතය කෙසේවත් අත්විඳිය නො හැකි ය. අනාගතය ගැන අපට ඇත්තේ බලාපොරොත්තු ය. එසේත් නැත්නම් ඒ පිළිබඳ අපට කිසිවක් කිව නොහැකි ය. අනෙක් අතට අතීතය ගැන අපට ඇත්තේ මතකයක් පමණක් ය. එනම් අතීත තොරතුරු ය. අපට අතීතයට ආපසු යා නො හැකි ය. අප අතීතය පිළිබඳ මතකය අත්විඳින්නේ වර්තමානයෙහි ය.

අනුරාධපුරයට ගිය ගමනක් ගැන අපට මතක් කළ හැකි ය. ඒ පිළිබඳ සියළු තොරතුරු අප සතුව නැත. ඇතැම් තොරතුරු ගිලිහී ගොස් ඇති අතර අපි ඇතැම් තොරතුරු එකතුකරගෙන ඇත්තෙමු. එදා ගමනෙහි දී සිදු වූ දේ ලෙස අද අප එදා නොසිදු වූ දේ කීමට, මෙනෙහිකිරීමට ඉඩ ඇත. අපේ මතකයේ නිවැරදිතාව පිළිබඳ ව අපට සහතිකවිය නො හැකි ය. කෙසේ හෝ අතීතය පිළිබඳ අපට කළහැක්කේ වර්තමානයෙහි දී මතක්කිරීම පමණකි. මතක්කිරීම යනු අප වර්තමානයෙහි දී අත්විඳින දෙයකි.

සිංහල සංස්කෘතියෙහි ප්‍රත්‍යක්ෂය වැදගත් වෙයි. ප්‍රත්‍යක්ෂය ඇත්තේ වර්තමානයෙහි ය. අතීතය අපට ප්‍රත්‍යක්ෂ නො වෙයි. එහෙත් අතීතය පිළිබඳ ප්‍රත්‍යක්ෂයක් අපට වර්තමානයෙහි දී ලබාගත හැකි ය. සිංහල භාෂාවේ අනාගත කාලය හඟවන රූපයක් නැතැයි අපි ඉහත කීවෙමු. එපමණක් නො වෙයි. සිංහලයන් බොහෝ විට අතීතය ප්‍රකාශකරන්නේ වර්තමානයෙහි ය. අප දන්නා අතීතයේ සිදු වූ දෙයක් පිළිබඳ ව ද අපි ඇතැම්විට වර්තමාන ස්වරූපයෙන් කතාකරමු.

අතීතයේ යම් දිනක සිදු වූ සිද්ධියක් පහත සඳහන් අයුරින් විස්තරකිරීම ඇතැමුන්ගේ සිරිත වෙයි. ළමයකු යම් දිනක පාසලට යද්දී කුළුමීමකු ඔහු පස්සෙන් එළ වූ සිද්ධියක් අපි මෙසේ විස්තර කරමු. “ළමයා දැන් ඔන්න උදේන් ම ඉස්කෝලෙට යනවා. එතකොට කුළු මීමෙක් පැත්තකින් ඉඳන් ළමයින්ට අනින්න පනිනවා. ළමයට කරන්න දෙයක් නැහැ දුවන්න පටන්ගන්නවා.” මෙහි දී අතීතයේ වූ සිද්ධියක් අපි වර්තමානයේ දී විස්තර කරමු.  සිංහල භාෂාවෙහි මෙවැනි ව්‍යවහාරයක් ඇත්තේ සිංහල සංස්කෘතියෙහි අතීතය ද වර්තමානයේ දී ප්‍රත්‍යක්ෂ කරගැනීමේ උත්සාහයක් ක්‍රියාත්මකකිරීමක් එහි පවත්නා නිසා විය හැකි ය.

වර්තමානය පමණක් ප්‍රත්‍යක්ෂයෙන් දතහැකි වීම සිංහලයන් හොඳින් දන්නා බව මෙයින් පැහැදිලි වෙයි. එහෙත් මේ සාමාන්‍ය පුද්ගලයන්ට ය. අභිඥා උපදවා ගත් ඇතැම් අයට අතීතය දැකගත හැකි යැයි කියැවෙයි. එසේ කරන්නේ කෙසේ දැයි අපි නො දනිමු. අතීතයේ සිදු වූ සිද්ධීන්හි තොරතුරු යම් ආකාරයකින් වර්තමානයෙහි ද පවතින්නේ ද? මේ තොරතුරු දැනගැනීමේ හැකියාව අභිඥා උපදවා ගත් ඇතැමුනට ලැබෙන්නේ ද? අභිඥා උපදවා ගත් අය කරන්නේ අතීතය පිළිබඳ යම් ආකෘතියක් වර්තමානයේ ඇති තොරතුරු ආශ්‍රයෙන් නිර්මානය කිරීම ද? මේ ප්‍රශ්න කිසිවකට අපට පිළිතුරු නැත. සමහරවිට ප්‍රශ්න පවා නිවැරදි නොවිය හැකි ය.

අභිඥා නැතත් අපි ද අතීතය පිළිබඳ ආකෘති තනන්නෙමු. ඉතිහාසය යනු අතීතයේ සිදු වී ඇති දේ හදාරණ ක්ෂෙත්‍රය වෙයි. ඉතිහාසය හැදෑරීම ද වර්තමානයේ කෙරෙන්නක් බව සිංහල බෞද්ධයනට අමුතුවෙන් කියාදිය යුතු නො වෙයි. ඉතිහාසය වුව ද හදාරන්නේ, ලියන්නේ නැත්නම් නිර්මානයකරන්නේ වර්තමානයෙහි ය. එපමණක් නොව ඉතිහාසය වර්තමානයට සාපේක්ෂ ය. වර්තමානයේ නිර්මානයකරන ඉතිහාසය වර්තමානයට සාපේක්ෂවීම පුදුමයක් නොවිය යුතු ය. සිංහල බෞද්ධයනට නම් එහි අරුමයක් නැත.

බටහිරයන් ඉතිහාසය පිළිබඳ ප්‍රශ්නයට දැන් දැන් යොමුවෙමින් පවතින බව පෙනෙන්නට ඇත. ඉතිහාසය ලියන්නේ වර්තමානයෙහි බව ඔවුන් විසින් අවබෝධකරගනු ලබමින් පවතියි. අද බටහිරයෝ දැනුම සාපේක්ෂ බව අවබෝධකරගනිමින් සිටිති. දැනුම සාපේක්ෂ බව සිංහල බෞද්ධ සංස්කෘතියට ආගන්තුක වූවක් නො වෙයි. දැනුම යනු නිර්මානයකරන දෙයක් බවත් ඒ නිර්මාන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම පිළිබඳ අවිද්‍යාව නිසා සිදුවන බවත් අපි

© Prof. Nalin De Silva

දනිමු. පටිච්ච සමුප්පාදායේ අවිජ්ජා පච්චයා සංඛාරා යනුවෙන් කියැවෙන්නේ අවිද්‍යාව නිසා සංස්කරණය කෙරෙන බව ය. මේ සංස්කරණ කුසල් අකුසල් වේවා දැනුම හා සම්බන්ධ ය. එසේ නිර්මානය කෙරෙන දැනුම එක් එක් අයගේ දැනුම ය යන්න ද ඉන් ගලා එයි. අප එක් එක්කෙනාට ඇත්තේ ඒ ඒ අයගේ දැනුම ය. දැනුම සාපේක්ෂ වන්නේ එබැවින් ය.

එබැවින් ඉතිහාසය ද සාපේක්ෂ වෙයි. එහෙත් මෙයින් අදහස්කරන්නේ ඕනෑම අයකුට ඕනෑම දෙයක් ඉතිහාසය යනුවෙන් ලිවිය හැකිය යන්න නොවන බව තේරුම් ගත යුතු ය. ඉතිහාසය යනුවෙන් අප නිර්මානයකරන්න අනෙක් සාධක සමග සංගත විය යුතු ය. අනෙක් දැනුම් සමග සංගත නොවන ඉතිහාස කෙතෙක් ලීව ද ඉන් ඵලයක් අත් නො වෙයි. අද මෙරට සිංහල බෞද්ධ විරෝධීන් විවිධ ඉතිහාස නිර්මානයකරන බව රහසක් නො වෙයි. ඒ ඉතිහාස ලිවීමේ එකම අරමුණ සිංහල බෞද්ධ සංස්කෘතියට මෙරට හිමිවිය යුතු තැන නැතිකිරීම ය. ඔවුන් ඒ ඉතිහාස ලියන්නේ වර්තමාන දෙමළ ජාතිවාදී ප්‍රශ්නයට සාපේක්ෂව ය.

ආර්යයන් නමින් හැඳින්වෙන අර්ධ වෛදිකයන් පැමිණීමට පෙර මෙරට සිටියේ ද්‍රවිඩයන් යැයි කීමට ඇතැම්හු මහත් උත්සාහයක් ගනිති. ඒ අතර තවත් අය ක්‍රිස්තියානිය සීගිරි කාශ්‍යප රජුගේ කාලයේ සිට මෙරට තිබෙන බවක් පෙන්වීමට උත්සාහ කරති. විවිධ පුද්ගලයන්ට එසේ උත්සාහ කළ හැකි ය. එහෙත් ඒ උත්සාහයේ ප්‍රතිඵල ලෙස ලියැවෙන ඉතිහාසය අනෙක් දැනුම් සමග සංගත විය යුතු ය. සංගත නැති ඉතිහාසයක් ලිවීමට තැත්කිරීමෙන් ම පෙන්නුම්කරන්නේ ඉතිහාසය පමණක් නොව සමස්තයක් ලෙස ගත්කල දැනුම ගැන ඔවුන්ට ඇති නො දැනුම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva